# කුසුම්සිරි සහ යශෝධරා රංග කාර්යයක් - ශ්‍රී ලංකා රංග නිකේතනයේ ඉදිරිපත් කිරීමක්



# දඟයා සහ මුත්තගෙ විත්ති

## පස්වන සහ හයවන වරටත්...

"ළමයින් සඳහා ළමයින් යොදාගෙන ළමා නාට්‍යයක් මේ තරම් උසස් මට්ටමින් මෙල්බර්න් නුවර වේදිකාගත වූවානම් ඒ මේ ප්‍රථම අවස්ථ ාව බව මගේ දැනීමයි, මගේ හැඟීමයි". වරුණ සාවින්ද - සන්නස 2008 මැයි කලාපය

කුසුම්සිරි ලියනආරච්චි සහ යශෝධරා සරච්චන්ද්‍රගේ "දඟයා සහ මුත්තගෙ විත්ති" නාට්‍ය දිත්වය සැබෑ නිර්මාණ කාර්යයකි. එය ශ්‍රී ලංකාවේ වේදිකාවේ නිර්මාණය වූයේ නම් බොහෝ සම්මාන දිනා ගන්නවා නොඅනුමානය. වින්දන - ආයුබෝවන් 2008 අප්‍රේල් කලාපය

"දඟයා සහ මුත්තගෙ විත්ති" සෑම ලාංකීය දරුවෙකුම නැරඹිය යුතු නාට්‍යය දෙකක් ලෙස මට හැඟෙයි. තරුපති මුණසිංහ - පහන 2008 ජූනි කලාපය

ඒ වූ කලී "දඟයා සහ මුත්තගෙ විත්ති" මංගල දර්ශනයෙන් පසුව ලද ප්‍රතිචාරයන්ගෙන් වාක්‍යය කිහිපයකි. මේ කියමන්හි සත්‍ය අසත්‍ය තාවය නාට්‍යයද්වය නැරඹූ ප්‍රේක්ෂකාගාරය දනිතියි හඟිමු. මෙතෙක් "දඟයා සහ මුත්තගෙ විත්ති" නැරඹීමට අවස්ථාව නොලද අයෙක් වෙතොත් ඔබට නැවත ඒ අවස්ථාව උදාවී ඇත. ඒ රොක්බෑන්ක් පාරමිතා සම්බුද්ධ විහාරයට ආධාර පිණිස පෙබරවාරි 08 වන ඉරිදා කිව් රෙනේසාන්ස් ශාලාවේදී නැවතත් "දඟයා සහ මුත්තගෙ විත්ති" වේදිකාගත වන හෙයිනි.

මෙල්බර්න් ශ්‍රී ලාංකික ජන සමාජයේ සාමාජිකයින්ගේ, දරු දැරියන්ගේ දායකත්වයෙන් නිර්මාණය වූ නිර්මාණයක් මෙසේ හයවන වතාවටත් වේදිකාගතවීම සුවිශේෂ සිදුවීමක් ද වනු ඇත.

යහපත් කලා නිර්මාණයක් රසවිඳීමට ළමයකු හෝ වැඩිහිටියකු හුරුවීමෙන් මානව දයාවෙන් හෙබි මනුෂ්‍යයකු බිහිවන බව පිළිගත් සාධකයකි. එමෙන්ම හොඳ කලා නිර්මාණයකින් ඇතැම් ළමයකුගේ හෝ වැඩිහිටියකුගේ ජීවිතයට සිදුවිය හැකි බලපෑමද සුළුපටු නොවේ. යාන්ත්‍රීකරනය වෙමින් පවතින අපේ අනාගත ලෝකයෙහි නියමුවන්ගෙන් අතලොස්සකගේ හෝ හදවත් තුළ තෙතමනයක් ඇතිකරලීමට, හැඟීම් දැනීම් ජනිතකරලීමට, තවකෙකුට ආදරය කළ හැකි ගරුකළ හැකි පිරිසක් බිහිකරලීමට කලා නිර්මාණ තුළින් වන මෙහෙය අතිමහත්ය. මෙවන් වූ පරමාර්ථ පෙරටුකොටගෙන ඉදිරියට ඇදෙන කලා මාධ්‍යයන් අතුරෙහි ළමානාට්‍යය නම් මාධ්‍යයට හිමිවනුයේ ප්‍රමුඛ ස්ථානයකි. මෙම මාධ්‍යයෙහි ඇති සුවිශේෂීබව විදහාපෑම උදෙසා පහත වදන්පෙල උපුටා දක්වමු.

"ළමා නාට්‍ය නිර්මාණය යනු ලෝකයේ ඇති ඉතා දුෂ්කර කාර්යයන්ගෙන් එකකි. මන්ද, එය ළමා මනස සුමට කොට පෝෂණය කිරීම සඳහා යොදාගතයුතු කාර්යයක් වන හෙයිනි. එසේම, ළමා නාට්‍ය යනු ළමයාගේ පෞරුෂ වර්ධනයට, බුද්ධි ප්‍රබෝධයට, මානව දයාවෙන් හෙබි පුරවැසියකු බිහිකිරීමට අවශ්‍ය පදනමක් සකස් කරනු ලබන ප්‍රබල මාධ්‍යයක් බව ද අමතක කළයුතු නොවේ". සෝමලතා සුබසිංහ

ළමා නාට්‍ය පිළිබඳ පුළුල් හැදෑරීම්හි නිරතවූ සෝමලතා සුබසිංහ කැටිකොට සටහන්කොට ඇති ඒ වදන්පෙලින් ළමා නාට්‍යකරනයේ ඇතැම් පැතිකඩයන් මනාව විශ්ලේෂනය වෙතැයි සිතමු.

දඟයා

දඟයා වූ කලී දඟකාර හා පැටවකු වටා ඉතා සරලව ගෙතූ කතාන්දරයකි. තම දෙමාපියනට වැඩිහිටියනට කීකරුවිය යුත්තේ ද ඔවුන්ගේ අවවාද අනුශාසනා කෙරෙහි සිත යොමුකල යුත්තේද මන්දැයි යන්න කෙරෙහි ළමාසිත්වල ද්වාරයන් විවරකරලීමට සමත් සුන්දර නාට්‍යයකි.

මුත්තගෙ විත්ති

ලාංකික ජන සාහිත්‍යයේ ප්‍රචලිත මහදැන මුත්තාගේ කතාන්දර කිහිපයක් ඇසුරුකොට ගනිමින් නිර්මාණය කර ඇති මුත්තගෙ විත්ති අපේ ජන සාහිත්‍ය, ජන සංගීතය ආදීන්ගේ පැතිකඩයන් ඉතා සොඳුරු ලෙසට ළමා මනසට සමීප කරලීමට සමත් වූ නාට්‍යයකි.

මෙම නාට්‍යද්වයේ තවත් විශේෂත්වයක් වනුයේ ළමයිනට මෙන්ම වැඩිහිටියනටත් එකසේ රසවිඳීමට හැකි අයුරින් නිර්මාණය වී තිබීමය.

කුසුම්සිරි සහ යශෝධරා ප්‍රමුඛ "දඟයා සහ මුත්තගෙ විත්ති" නාට්‍ය කැළ තම නිර්මාණද්වය තුළින් තවත් මහඟු වූ සත්කාරයක නිරතවී සිටියි. පසුගිය ජූලි මාසයේ බෙරික් ශාක්‍යමුනි සම්බුද්ධ විහාරයට ආධාර පිණිස තම නිර්මාණද්වය කැපකළ මේ නාට්‍ය කැළ මෙවර රොක්බෑන්ක් පාරමිතා සම්බුද්ධ විහාරයට ආධාර පිණිස නාට්‍ය දර්ශනයන් ඉදිරිපත් කරයි.

"දඟයා සහ මුත්තගෙ විත්ති" වේදිකාව මත සජීවී කරවන නාට්‍ය කැළ මෙසේය. කුසුම්සිරි සහ යශෝධරා මෙහෙයවන ළමා නාට්‍ය වැඩමුළුවේ ළමා කැළ,

හසිනි ඉලංගරත්න, වසුන්දරා ඕපනායක, රන්ඳු වල්පොල, නෙවින් වල්පොල, මංජිත විජේසිංහ, තිළිණි රණසිංහ, නිර්මාණි සේනාරත්න, නෙත්මා මල්ලව, ජනනි සේනාරත්න, දිලීෂා වල්පොල, කසුනි පාදුක්කගේ, මධුර බණ්ඩාර, දිලිණි ජයසිංහ, තිෂාරා කත්රිආරච්චිගේ, සම්මානි සේනාරත්න, විනුකි මල්ලව, හසිත බණ්ඩාර, මනීෂා ගමගේ, දෙව්මි බණ්නැහැක, සමිත් ජයසිංහ, ලක්ෂාන් වල්පොල, කසුන් මුණසිංහ, කාවින්ද මුණසිංහ, තරුෂ පීරිස්, අමානදී දිසානායක, නිලූෂිනී ජයරත්න, ඉන්ද්‍ර ලියනආරච්චි

රුක්මල් නිරෝෂ සහ භානුක මනෝරත්න යන ප්‍රවීණ ශිල්පීන් දෙපලත් සමඟ වසන්ත මුතුමාල, ලක්ෂ්මන් ගමගේ, දිලිනි වල්පොල යන වැඩිහිටි ශිල්පීන් ද රංගනයෙන් දායකවනු ඇත. යශෝධරා සරච්චන්ද්‍ර විසින් නිර්මිත සංගීතය මෙහෙයවීම රොහාන් නෙත්සිංහ විසින් සිදුකරයි. ඊට දායකවන වාද්‍යවෘන්දය මෙසේය. ඉන්දික ෆර්ඩිනෑන්ඩු, වගීෂා වෙල්ලාලගේ, කිත්සිරි වීරසිංහ, සචිනි ඩයස්, පසන් මල්ලිකරාලලාගේ, තිසර දිසානායක, නුවන් රණසිංහ, තිළුණ ගමගේ, නිමාෂිණී පැල්පොල.

වේදිකා පරිපාලනයෙන් උදය බණ්ඩාර, නිශ්ශංක මල්ලව, වසන්ත වල්පොල සහ රංගාලෝකයෙන් සුපින් බණ්ඩාර, ගාමිණී රණසිංහ යන ශිල්පීන්ද දායක වෙති.

ඉතින් කුසුම්සිරි සහ යශෝධරා ප්‍රමුඛ ශ්‍රී ලංකා රංග නිකේතනයේ දරු දැරි කැළත් ඊට දායකවන වැඩිහිටි ශිල්පීනුත් "දඟයා සහ මුත්තගෙ විත්ති" ප්‍රේක්ෂකාගාරයට ඔබට සාදරයෙන් ඇරයුම්කර සිටියි.

